
# 05 සමගිය බලය වේ



වේයා පුංචි සතෙක්.

උෟ හරි ම කඩිසර යි.

පුංචි වුණාට

උෟ කරන්නේ ලොකු වැඩ.

වේ යාළුවෝ එකතු වෙලා,

මැටි ගුළි ගෙනැල්ලා,

ගෙයක් හැදුවා.

වේයෝ හැමෝම සමගියෙන් එකමුතු ව

මේ ගෙදර ජීවත් වුණා.

මේ ගෙදරට කියන්නේ

තුඹස කියලා.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.


දවසක් මේ තුඹසට ලොකු නයෙක් රිංගුවා.;

රිංගලා, ඒකේ ජීවත්වෙන්න පටන් ගත්තා.

පුංචි වේයන්ට හරි ම දුක යි.

වේයෝ යාළුවොත් එක්ක එළියට ඇවිල්ලා

අඬ අඬා හිටියා.



අපි වෙන ගෙයක් හදමු.

පුංචි වේයෙක් කිවුවා.

ඒත් ඒක ලේසි නෑ,

හුඟක් කල් යයි,

තව කෙනෙක් කිව්වා.

ඔව් ඔව්, එතකොට

වැහි කාලෙත් ඒවි,

ලොකු වේයෙක් කිව්වා.

ඒ වෙලාවේ **කඩියෝ** රැළක් මෙතැනින් **යන්න ගියා.**

එයාලාට **ඇහුණා** වේ යාළුවෝ අඬනවා.

ඇයි යාළුවනේ අඬන්නේ? **කඩියෙක්** ඇහුවා.

වේයෙක් විස්තරය කිව්වා.

ඒක අහගෙන හිටපු කඩියා මෙහෙම කිව්වා:

අපි හැමෝම තුඹසට **රිංගලා**

නයාගේ ඇඟේ එල්ලෙමු.

හැබැයි, කවුරුත්


එකා වගේ **එකමුතු** වෙලා

ඉන්න ඕනෑ.

කඩියොයි, වේයොයි

ඔක්කෝම ඒකට

කැමැති වුණා.



ඊට පස්සේ වේයොයි, කඩියොයි එකතු වෙලා තුඹසට රිංගුවා.;

රිංගලා, නයාගේ ඇගේ එල්ලුණා.


නයාට කර ගන්න දෙයක් නැති වුණා.

නයාට හොඳට ම කිති කැවුණා.

නයා එහාට ඇඹරුණා; මෙහාට ඇඹරුණා.

එතකොට වේයොයි, කඩියොයි තව තවත් තදින්

උගේ ඇගේ එල්ලුණා.



නයාට බේරෙන්න ම

බැරි වුණා.

නයා බොහොම අමාරුවෙන්

ඇස් ඇරලා වටපිට බැලුවා.

ඒත් කිසි දෙයක් පෙනුණේ නැහැ,

ඇස් දෙක ම වැහිලා.

අමාරුවෙන් තුඹසෙන්

එළියට යන පාර

හොයා ගත්තා.

නයා ඉක්මනින් ම

තුඹසෙන් එළියට ආවා.



උඹ හොඳ හුස්මක් අරගෙන වටපිට බැලුවා.

මීට පස්සේ කවදාවත්

අනුන්ගේ දේවල් අයිති කර ගන්නේ නෑ කියලා,

නයා වේගයෙන් යන්න ගියා.

වේයෝ, කඩියන්ට ස්තුති කළා.

සමගියේ බලය පෙන්වමින් සියල්ලෝ ම සතුටු වුණා.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## වචන මාලාව


| | |
|---|---|
| වේයා | - கறையான் |
| පුංචි | - சின்ன சிறிய |
| සතෙක් | - பிராணி |
| කඩිසර යි | - சுறுசுறுப்பானது |
| ලොකු | - பெரியது |
| වේයෝ | - கறையான்கள் |
| ජීවත් වුණා | - வாழ்ந்தன |
| තුඹස | - புற்று |
| කඩියා | - கட்டெறும்பு |
| රිංගුවා | - நுழைந்தது |
| රිංගලා | - நுழைந்து |
| කඩියෝ | - கட்டெறும்புகள் |
| යන්න ගියා | - சென்றது |
| ඇහුණා | - கேட்டது |
| එකමුතු වෙලා | - ஒன்று சேர்ந்து |
| එල්ලුණා | - தொங்கின |
| නයා | - பாம்பு |
| එළියට ආවා | - வெளியே வந்தது |


## ක්‍රියාකාරකම 01


**පින්තූර ගළපමු. කියවමු. ලියමු.**


படங்களை ஒழுங்குபடுத்துவோம், எழுதுவோம், வாசிப்போம்.

1. පුංචි වේයෝ  ගෙනාවා.

2. ලස්සන  හැදුවා

3.  තුඹසට රිංගුවා

4. පුංචි  අඬ අඬා හිටියා.

5.  වේයන්ට උදවු කළා.

## ක්‍රියාකාරකම 02

**යා කරමු. කියවමු.**

**இணைப்போம், வாசிப்போம்.**



| අ | ආ |
|---|---|
| 1. වේයා | සත්තු |
| 2. කඩියා | ගෙවල් |
| 3. සතා | වේයෝ |
| 4. නයා | තුඹස් |
| 5. ගෙදර | කඩි |
| 6. තුඹස | නයි |

## ක්‍රියාකාරකම 03

**පිළිතුරු කියමු. ලියමු.**

**விடை கூறுவோம், எழுதுவோம்**

1. වේයා ජීවත් වන්නේ කොහේ ද? ..................................
2. තුඹස සෑදීමට ගන්නේ මොනවා ද? ...............................
3. තුඹසට රිංගා ගත්තේ කවුද? ..........................................
4. එළියේ අඬ අඬා හිටියේ කවුද? ......................................
5. වේයන්ට උදවු කළේ කවුද? ..............................................

## ක්‍රියාකාරකම 04

**පිළිවෙළට ගළපමු. කියවමු. ලියමු.**
**ஒழுங்குபடுத்துவோம், வாசிப்போம், எழுதுவோம்.**

1. ඒකට කියන්නේ තුඹස කියලා.
2. වේයෝ ගෙයක් හදන්න පටන් ගත්තා.
3. තුඹසට ලොකු නයෙක් රිංගුවා.
4. ටික දවසකින් ලොකු ගෙයක් හැදුවා.
5. වේයොයි, කඩියොයි නයාගේ ඇඟේ එල්ලුණා.
6. කඩි රැළ වේයන්ට උදව්වට ආවා.



1. ........................................................
2. ........................................................
3. ........................................................
4. ........................................................
5. ........................................................
6. ........................................................

## ක්‍රියාකාරකම 05

වචන තෝරමු. හිස්තැන් පුරවමු.

பொருத்தமான சொற்களைத் தெரிவு செய்வோம், இடைவெளிகளை நிரப்புவோம்.


1. හැදුවා ..............................
2. ජීවත් වුණා ..........................
3. රිංගුවා ........................
4. හිටියා .........................
5. කිව්වා .........................
6. එල්ලුණා ..................
7. බැලුවා ......................


බලනවා
රිංගනවා
එල්ලෙනවා
හදනවා
ජීවත් වෙනවා
ඉන්නවා
කියනවා

## ක්‍රියාකාරකම 06

රූප බලා කතාව කියන්න. ලියන්න.

படத்தைப் பார்த்து கதை கூறுங்கள், எழுதுங்கள்.







## ක්‍රියාකාරකම 07

ඔබ දන්නා කතන්දරයක් කියන්න.

உங்களுக்குத் தெரிந்த கதை ஒன்றைக் கூறுங்கள்.